# අපි මුතු ඇටයේ දරුවෝ
# We, Children of the Pearl




**ප**සුගිය දෙසැම්බර් 15 වෙනි සෙනසුරාදා ලන්ඩනයේ ඉම්පීරියල් විද්‍යා ලීය ශාලාවේදී ශ්‍රීලාංකික සංස්කෘතික සංදර්ශණයක් පැවතියේ ය. එය නම් කර තිබුණේ අපි මුතු ඇටයේ දරුවෝ **We Children of the Pearl** යනුවෙනි. එය මුළුමනින් සංවිධානය කරන ලද්දේ ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසා රිස් කායර්‍ාලයයි.

එම සංදර්ශනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රීලංකාවට අයත් සිංහළ, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී විවිධ ජනවර්ගයන්ට අයත් ජනතාව ජාතික ආගමික භේදයෙන් තොරව එක් එක්සත් ශ්‍රීලංකාවක් කෙරෙහි යොමු කරවීමට බව මහකොමසාරිස් කායර්‍ාලය පවසයි. එමගින් එකිනෙකා අතර අන්‍යොන්‍ය බැඳීම වඩාත් තහවුරුවන්නේයයි එය වැඩි දුරටත් පෙන්වා දෙයි. **අපි කවුරුත් මුතු ඇටයේ දරුවෝ වෙමු** යයි එම සංදර්ශණය සඳහා සංගීතඥ නිමල් මෙන්ඩිස් විසින් ගීතයක්ද නිර්මාණය කරන ලදී.

සිංහළ දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී සංස්කෘතීන් නියෝජනය වන පරිදි නැටුම් හා නාට්‍යාංග සැකසී තිබිණ. සංදර්ශනය නැරඹීමට ශාලාව පිරෙන්නට ප්‍රේක්ෂක පිරිසක් සිටියෝය. වේදිකාවට ආ ජවනිකා කාගේත් සිත්සතන් ප්‍රබෝධකරන්නට සමත්වූ බැව් නැගුණු අතපොලසන් නාදයෙන් කියැවිණ. එය සැබැවින්ම විනෝදජනක සන්ධ්‍යාවක් විය.

**Photographs by Nimal Navaratne**
**නිමල් නවරත්න**



සංදර්ශණය නැරඹීමට පැමිණ සිටි ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක ආනන්ද සංගරී මහතා ශ්‍රීලංකා මහකොමසාරිස් තුමියට සතුට පළකරයි.






# කොටි ක්ලේමෝ බෝම්බයෙන් ඇමති ද. මු. දසනායක මියයයි



**ජා**තිය ගොඩනැගීමේ ඇමති ද. මු. දසනායක මහතා මෙම ජනවාරි 8 වෙනි දා කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගයේ ජා ඇල රුක්මණී දේවි හන්දියේදී කොටි ත්‍රස්තවාදීන් විසින් අටවා පුපුරවා හරින ලද බෝම්බය කට ගොදුරුව ජීවිතක්ෂයට පත්විය. ඒ මහතා සමග රියේ සිටි ආරක්ෂක නිලධාරියෙක්ද මියගොස් ඇත. නව වසරේ පළමු පාර්ලිමේන්තු රැස්වීම් වාරයට සහභාගිවීම පිණිස පුත්තලමේ ආනමඩුවේ සිය නිවසේ සිට කෝට්ටේ බලා යමින් සිටි ඔහුගේ ජීප් රථයබෝම්බ ප්‍රහාරයට හසුවීය.

ජාඇල ඉහතකී හන්දියේ පාර අයිනේ පාර අයිනේ වූ පාළු ඉඩමක පාර අයිනටම වෙන්නට තිබූ ගසක මෙම බෝම්බය රඳවා තබා තිබුණු බැව් සොයාගෙන ඇත. බෝම්බය අටවා තිබූ ස්ථානය සෙනග පාර මාරුවන තැනක්ද නිසා සාමාන්‍යයෙන් එතැනදී බොහෝ වාහන වේගය ඉතාම අඩුකරන බැවින් හරියටම අවශ්‍ය රථයට ඉලක්කය ගැනීම එතැනදී පහසු වන බවද පොලීසිය කියයි.

මෙම පිපිරීමෙන් පුද්ගලයින් දහ දෙනෙකු තුවාල ලැබූ අතර බරපතල තත්වයක සිටි ඇමති දසනායක මහතා වහා රාගම රෝහලට ගෙනයන ලද නමුත් රෝහලේදී මියගියේ ය.

“මචං නන්දෙ අපි කවදා හෝ මැරෙන මිනිස්සු. මගේ අම්ම පෙරියමඩුවෙ ගමේ තනිවෙලා. උන්දැට ළිඳෙන් නාන්න බැහැ. මැරෙන්න ඉස්සෙල්ල මචං අම්මට නාන්න ටැංකියක් හදල දීලා, ටැප් එකක් දාලා බාත්රූම් එකක් හදල දෙන්න ඕන” යයි ද. මු. දසනායක ඇමතිවරයා මියයන්නට මොහොතකට පෙර සිය පෞද්ගලික ලේකම් යූ. ඩබ්. නන්දසේන මහතාට තම මොබයිල් දුරකථනයෙන් අමතමින් කියා ඇත.

“ඇමතිතුමා ඒ කතා කරලා ඉවර වෙනවාත් එක්කම ලොකු පිපිරීම් සද්දයක් මට ඇහුණා. ඒ සමග ඇමතිතුමාගේ පෝන් එක නතර වුණා. පස්සෙ බන්දුකුමාර සාජන් මහත්තෙයා පෝන් කරලා කිව්වා ඇමතිතුමා බ්ලාස්ට් එකකට අහුවුණා කියලා” පෞද්ගලික ලේකම් නන්දසේන මහතා ප්‍රවෘත්ති වාර්තාකරුවන්ට කීය.

කොටි ත්‍රස්තවාදීන් පහුගිය කාල සීමාවේ කොළඹට බෝම්බ හා ඒවා හදන අමු ද්‍රව්‍යයද තොග පිටින් ගෙනැත් සඟවා තබා ඇත. උතුරේ සිට එන ලොරි පරීක්ෂා කිරීමේදී බොහෝ එවැනි පුපුරණ ද්‍රව්‍ය අසුවූ නමුත් අසු නොවුණු තොග බොහොමයක් කොළඹ අවට සඟවා තිබෙන බව නිසැකය. ඒ සමගම උතුරේ සිට පැමිණි කොටි ත්‍රස්තවාදී දෙමළ තරුණයින් රාශියක් කොළඹ අවට කාමර සහ ලොජ්වල නැවතී සිටින බව ඒ තැන් පරීක්ෂාකිරීමේදී අසුවී ඇත. ඔවුන් අත්අඩංගුවට ගන්නා විට මිනිස් අයිතිවාසිකම් කඩනවායයි රජයට එරෙහිව චෝදනා නැගේ.





Wishing all Our Customers a Happy & Prosperous New Year..

Don't book your next Air Ticket, until you speak to us!

Sri Lanka & Worldwide On Any Airline

HolidayAir
A Travel Experience to Remember

The most talked about Sri Lankan Travel Agent in the UK

MCG Mike Cooke Group · ATOL PROTECTED 9425 · IATA

Colombo Return from...

ROYAL JORDANIAN £220 + taxes
KUWAIT AIRWAYS £305 + taxes
KLM £315 + taxes
SriLankan £495 + taxes (Free Trip to S. India/Far East)*

A Free Money Transfer to Sri Lanka from Fastcash on every air ticket booked with Holiday Air!

020 8882 2626 www.holidayair.com